B

# නිවේදනය

2024 වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත සලකා බැලීම පිණිස කාරක සභා අවස්ථාවේ විවාදය 2023 නොවැම්බර් 22 දින එනම් අද දින ආරම්භ කිරීමට නියමිත බැවින් පූර්ණ පාර්ලිමේන්තු කාරක සභා අවස්ථාවේ විවාදයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් සභා ගර්භය තුළ අසුන් ගැනීම පිළිබඳ රීති සම්බන්ධයෙන් සියලුම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ දැන ගැනීම සහ අවධානය සඳහා මතු සඳහන් නිවේදනය මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට කැමැත්තෙමි.

සාම්ප්‍රදායිකව අයවැය කාරක සභා අවස්ථාවේදී රාජ්‍ය අමාත්‍යවරයාට, තම කැබිනට් අමාත්‍යවරයා ආසන්නයේ අසුන්ගත හැකි වුවද, විවාදයේදී කථා කිරීම වෙන්කරන ලද අසුනේ සිට පමණක් සිදු කළ යුතු බව මෙම ගරු සභාවේ අවධානයට යොමු කරවීමට කැමැත්තෙමි.